**අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය - 2019**
**-----------------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළමණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිසංශෝධනයන් ලෙස ගැලපිය යුතු මණ්ඩලයේ රථ වාහන හා වායු සමීකරණ යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ප්‍රතිශතය සියයට 20 සිට සියයට 12.5 දක්වා අඩු කිරීම 2017 වර්ෂයේදි අතීතානුයෝගීව ගැලපීම හේතුවෙන් ජංගම නොවන වත්කම්වල අගය රු.14,111,960 ක් වැඩියෙන් දක්වා තිබුණි. මෙම වරද නිවැරදි කිරීමට ප්‍රවර්ථන වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | වායු සමීකරණ යන්ත්‍ර හා මෝටර් රථ වාහන ක්ෂය වෙන් කිරීමේ ප්‍රතිශතය අතීතානුයෝගීව ගැළපීම් නිසා සිදු වූ වෙනස්කම් නිවැරදි කිරීමට අදාල ජර්නල් සටහන යෙදීමට සටහන්කර ගතිමි. | ජංගම නොවන වත්කම්වල එලදායී ජීවන කාලය පදනම් කරගෙන එම වත්කම් ක්ෂය කිරීමටත් වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි අංක 507 (2) හා 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදු නොකොට මණ්ඩලය විසින් 2019 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල අගය රු.41,179,616 ලෙස ගිණුම්ගත කොට තිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අදාළ සියලු කටයුතු සැලසුම් කර තිබුණද හදිසියේ රට තුළ ඇති වූ තත්ත්වයත් සමග එය සම්පූර්ණ කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් ඉතිරි කටයුතු සම්පූර්ණ කොට ජුලි මාසය අවසාන වන විට වාර්තාව සැපයීමට කටයුතු යොදා ඇත. | ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි අංක 507 (2) හා 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය අනුව කටයුතු කළයුතු බව. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය | ගිණුම් වර්ෂය අවසාන වී දින 150 කට පසුව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කලයුතු වුවත් 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2020 ජුනි 22 වන විටත් පිළියෙල කර නොතිබුණි | 2018 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාවේ සියලු තොරතුරු රැස් කොට මෘදු පිටපත සකස් කර අවසන්ව ඇති අතර මුද්‍රණය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව කටයුතු කළයුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,433,653 ක අතිරික්තයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,139,790ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,706,137ක අඩු වීමක් නිරීක්ෂණය විය. මෙම අඩු වීමට 2019 වර්ෂයේ ආසියානු පැසිපික් ප්‍රතිතන සහයෝගිතාව තුල්‍ය ඇගයීම (APAC Peer Evaluation) සඳහා වියදම රු.3,286,128ක් **වැඩිවීම** ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

මණ්ඩලයේ ප්‍රතිතන ආදායම රු.2,367,943කින් වර්ධනය වී ඇති අතර පෞද්ගලික පඩි නඩි වියදම රු.3,717,404කින් වර්ධනය වී තිබුණි. ගමන් වියදම් සඳහා දරන ලද වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂයේදී රු.1,158,267කින් අඩු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02ක් තෘතීක මට්ටමේ තනතුරු 02ක් හා ද්විතීක මට්ටමේ තනතුරු 01 ක් 2020 ජුනි 22 දින වන විට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය වූ අතර පුරප්පාඩු වෙනුවෙන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට අනුමත කර තිබෙන බඳවා ගැනීමේ පටිපාටිය සඳහා ඇතුළත් විය යුතු වෙනස්කම් ඇතුළත් කොට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සඳහා වන නව බඳවා ගැනීමේ පටිපාටිය මේ වන විට සකස් කොට ඇති අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හි අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කොට ඇත. තවද ඉහත පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇති අතර මේ සඳහා විශේෂිත අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලෙස මැතිවරණ කොමසාරිස්ගෙන් ද විශේෂ ඉල්ලීමක් සිදුකොට ඇත.<br><br>මෙම හදිසි බඳවා ගැනීම් වල අවශ්‍යතාව තේරුම් ගත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හැකි ඉක්මනින් බඳවා ගැනීමේ පටිපාටියට අවශ්‍ය සංශෝධන ඇතුළත් කරමින් මෙම තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබා දෙන බව පොරොන්දු වී ඇත. එබැවින් එම අවශ්‍යතා සපුරා ගත් සැනින් මෙම තනතුරු සඳහා අවශ්‍ය බඳවා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කරන බැව් කාරුණිකව දන්වමි. | තනතුරු පුරප්පාඩු වෙනුවෙන් බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කළයුතු බව. |
| (ආ) | අතිරේක අධ්‍යක්ෂ තනතුර කාර්යමණ්ඩල පරිපාටිය අනුමත කරගත් දින සිටම පුරප්පාඩුව පවතින අතර බඳවාගැනීම සඳහා 2012 වර්ෂයේ සිට කටයුතු සැලසුම් කර තිබුණද එම තනතුරට බඳවා ගැනීම් සිදු කර නොතිබුණි. අංක සීඑම්එස්/1601 හා 2014 ඔක්තෝබර් 14 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව වසරින් වසර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේ පදනම මත බඳවාගැනීමට අනුමැතිය ලැබී තිබියදීත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අතිරේක අධ්‍යක්ෂ තනතුර දැනට පවතින්නේ කොන්ත්‍රාත් පදනම මතය. මෙම තනතුර නැවත පූර්ණකාලීන තනතුරක් ලෙස පත්කර ගැනීම සඳහා දැනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීම ආරම්භ කොට ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා ලබාදෙන තීරණය මත ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වමි. | තනතුරු පුරප්පාඩු වෙනුවෙන් බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මණ්ඩලය විසින් අනුකූලතා තක්සේරු කටයුතුවල යෙදවීමට විධායක මට්ටමට පහළ ශ්‍රේණිවලට බඳවා ගැනීමේ තනතුරු ඇති කිරීමට දිගින් දිගටම කටයුතු කර නොතිබූ අතර මේ හේතුවෙන් ආයතනයේ කටයුතු ප්‍රවර්ධනය කිරීමට නොහැකිවී තිබූ බව නිරීක්ෂණය විය. | අනුකූලතා තක්සේරු කටයුතු දැනට සිදු කරනු ලබන්නේ සහකාර අධ්‍යක්ෂක (ප්‍රතීතන) හා නියෝජ්‍ය අධ්‍යක්ෂක (ප්‍රතීතන) යන තනතුරු දෙක මගිනි. තවද අදාළ ප්‍රතීතන කටයුතු සඳහා සුදුසුකම් ලත් බාහිර තක්සේරුකරුවන් යොදා ගැනීම සිදු කරයි. විධායක මට්ටමට පහළ ශ්‍රේණි පිළිබඳව සැලකීමේදී, ප්‍රතීතන අයදුම්පත් ලබා ගැනීම අවශ්‍ය ලියවිලි සම්පූර්ණ කර ගැනීම, ගෙවීම් සඳහා ඉන්වොයිස් පත්‍ර සකස් කිරීම සිදු කරනු ලබන්නේ ඒ සඳහා විශේෂිත පුහුණුවක් ලබා දුන් කළමනාකරණ සහකාරවරයෙකු විසිනි. | මණ්ඩලයේ කටයුතු පුළුල් කිරීමට හා විධායක මට්ටමේ පුරප්පාඩු පුරවා ගැනීම සඳහා ප්‍රතීතන ක්‍රියාවලියට සෘජුව සම්බන්ධවන දෙවනපෙළ කණ්ඩායමක් පවත්වාගෙන යා යුතු බව. |